b) පහත ප්‍රතික්‍රියාවල දී ලැබෙන ඵලයන් දී ඇති කොටු තුළ ලියන්න.

i. $CH_3CH = CH_2 \xrightarrow{Br_2 / CCl_4} P$

ii. $CH \equiv CH \xrightarrow{\text{වැඩිපුර } Na} Q$

iii. $(CH_3)_2 C = CH_2 \xrightarrow{HBr/\text{පෙරොක්සයිඩ}} R$

iv. $CH_3CH = CHCH_3 \xrightarrow{\text{සා. } H_2SO_4} S \xrightarrow{H^+/H_2O/\Delta} T$

v. $CH_3C \equiv CH \xrightarrow[HgSO_4 /\Delta]{dil\ H_2SO_4} U$

vi. $CH_3C \equiv C - C(CH_3)_2 - CH_3 \xrightarrow[BaSO_4/quinoline]{H_2 / Pd} V$

vii. $C_2H_6 + \text{ වැඩිපුර } Cl_2 \xrightarrow{\text{හිරු එළිය}} W$

| | | |
|---|---|---|
| P | Q | R |
| S | T | U |
| V | W | |

**රසායන විද්‍යාව - 2019 - 12 ශ්‍රේණිය (තෙවන වාර පරීක්ෂණය)**
**B - කොටස - රචනා**
**● මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(05) (a) i. සම්මත උදාසීනිකරණ එන්තැල්පිය අර්ථ දක්වන්න.

ii. ජලීය ද්‍රාවණයේ දී $CO_3^{2-}$ (aq) හා $HCO_3^-$(aq) අයන පහත අයුරු අම්ල සමඟ උදාසීනකරණය වේ.
$CO_3^{2-}(aq) + 2H^+(aq) \rightarrow H_2O(l) + CO_2(g) \rightarrow$ (1)
$HCO_3^-(aq) + H^+(aq) \rightarrow H_2O(l) + CO_2(g) \rightarrow$ (2)
$1\ moldm^{-3}$ $NaHCO_3$ ද්‍රාවණයක $40cm^3$ ක් සහ $1\ moldm^{-3}$ HCl ක් ද්‍රාවණයක $40cm^3$ ක් මිශ්‍ර කළ විට සිදුවන උෂ්ණත්ව වෙනස $-0.5C^0$ක් විය. ද්‍රාවණයේ විශිෂ්ඨ තාප ධාරිතාව $4.2\ JK^{-1}cm^{-3}$ යැයි උපකල්පනය කර ඉහත (2) ප්‍රතික්‍රියාවේ සම්මත එන්තැල්පි වෙනස ගණනය කරන්න.

iii. පහත දී ඇති දත්ත ද යොදා ගෙන (2) ප්‍රතික්‍රියාවේ $\Delta H^\theta$ ගණනය කරන්න.

| විශේෂය | $\Delta H_f^\theta$ $(kJmol^{-1})$ |
|---|---|
| $H_2O$ (l) | -285.8 |
| $CO_2$ (g) | -393.5 |
| $HCO_3^-$ (aq) | -692 |
| $H^+$(aq) | 0 |

iv. ඉහත (iii) දී ලැබුණු අගයට වඩා (ii) දී ලැබුණු අගය කුඩා වීමට හේතුව කුමක්ද?

(b) (i) පහත දැක්වෙන එන්තැල්පි අගයන් තුලිත සමීකරණ මඟින් දක්වන්න.

$CaCO_3(s)$ වල සම්මත උත්පාදන එන්තැල්පිය = $-1206\ kJmol^{-1}$
$C_8H_{18}(l)$ වල සම්මත දහන එන්තැල්පිය = $-2200\ kJmol^{-1}$
Na වල සම්මත ඌර්ධවපාතන එන්තැල්පිය = $+108\ kJmol^{-1}$
$CH_4(g)$ වල සම්මත බන්ධන විඝටන එන්තැල්පිය = $+428\ kJmol^{-1}$
$I_2(s)$ සම්මත පරමාණුකරණ එන්තැල්පිය = $+106.6\ kJmol^{-1}$

(c) $I_2(s)$ වල සම්මත උර්ධවපාතන එන්තැල්පිය $62.2\ kJmol^{-1}$ වේ නම්, $I_2(g)$ වල සම්මත බන්ධන විඝඨන එන්තැල්පිය ගණනය කරන්න.

(06)(a) (i) චාලක සමීකරණය ලියා එහි ඇති සංකේත සියල්ල හඳුන්වන්න.

(ii) පරිපූර්ණ ලෙස හැසිරෙන වායුවක් සම්බන්ධයෙන් $\overline{C^2}$, $T$ සහ $M$ අතර ඇති සම්බන්ධතාවය දැක්වෙන සමීකරණය ලියන්න.

(iii) $227^0C$ ඇති පරිපූර්ණ ලෙසින් හැසිරෙන මවුලික ස්කන්ධය $50gmol^{-1}$ වන X නම් වායුවක වර්ග මධ්‍යන්‍ය වේගය ගණනය කරන්න.

(b) $0.25\ moldm^{-3}$ $Na_2SO_4$ ද්‍රාවණයක $500cm^3$කට $BaCl_2(s)$ එල $24.96g$ ක් එකතු කර ප්‍රතික්‍රියාවීමට සළස්වන ලදී. ලැබෙන අවක්ෂේපයේ ස්කන්ධය ගණනය කරන්න.
$(Ba = 137, S = 32,\ O = 16, Cl = 35.5)$

c) පහත දැක්වෙන ඒවාට හේතු පැහැදිලි කරන්න.

(i) කාමර උෂ්ණත්වයේ දී $H_2S$ වායුවක් ලෙස පවතින අතර $H_2O$ ද්‍රවයක් වීම.

(iii) $MgCl_2(s)$ වලට වඩා $NaCl(s)$ වලට ඉහළ ද්‍රවාංකයක් තිබීම.

(07) (a) $A, B$ සහ $C$ සංකේත වලින් දක්වා ඇත්තේ අන්තරික මූල ද්‍රව්‍ය නැති ආවර්තයක පිහිටි අලෝහමය මූල ද්‍රව්‍ය තුනකි. ඒවා දී ඇත්තේ ආවර්තයේ ඇති පිළිවලට නොවේ. A සමාන්‍ය තත්ව යටතේ වායුවකි. නමුත් B සහ C ඝන මූලද්‍රව්‍ය වේ. C සහ A සංයෝජනයෙන් $CA_2$ සහ $CA_4$ ලෙස සංයෝග දෙකක් සාදයි. $CA_4$ සීසෝ හැඩැති වේ. $B$ සහ $A$ සංයෝජනයෙන් $BA_6^-$ සහ අෂ්ඨතලීය හැඩැති ඇනායනය සාදයි.

(i) A, B සහ C මූල ද්‍රව්‍ය තුන හඳුනාගන්න.

(ii) C මඟින් සාදන $HCO_4^-$ ඇනායනයේ ලුවිස් ව්‍යුහය අඳින්න.

(iii) $CA_2$ අණුවේ හැඩය අපෝහනය කරන්න.

(iv) ඉහත මූල ද්‍රව්‍ය අතරින් අඩුම ප්‍රථම අයනීකරණ ශක්තිය ඇත්තේ කුමකටද?

(b) (i) X නම් අකාබනික ලවණයක් පූර්ණ තාප වියෝජනය කළ විට $N_2O(g)$ සහ $H_2O(g)$ 1: 2 මවුල අනුපාතයට ලැබේ. X හි ආනුභවික සූත්‍රය කුමක්ද?

(ii) X හි $M = 80\ g\ mol^{-1}$ වේ නම් එහි අණුක සූත්‍රය කුමක්ද?

(iii) X හි අන්තර්ගත කැටායනනයේ සහ ඇනායනයේ ලුවිස් ව්‍යුහ අඳින්න.

(iv) X සංයෝගය තාප වියෝජනයේ දී ඉහත කැටායනයේ ඔක්සිකරණය වීමට අදාළ තුලිත අර්ධ අයන ඉලෙක්ට්‍රෝන සමීකරණය ලියන්න.

(v) X තාප වියෝජජනයේ දී එහි ඇනායනය ඔක්සිහරණය වීමට අදාල තුලිත අර්ථ අයන ඉලෙක්ට්‍රෝන සමීකරණය ලියන්න.

## C - කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(08) $(a)$(i) පහත දැක්වෙන සංයයෝග වල ව්‍යුහ අඳින්න.

1. ප්‍රකාශ සක්‍රිය වන සරළම ඇලකේන දෙකෙහි ව්‍යුහය.
2. ප්‍රතිරූප අවයව සමාවයවිකතාවයක් පරත්‍රිමාණ සමාවයවිකතාවයක් යන දෙකම පෙන්වන සරළම ඇල්කීනයේ වයුහය.
3. $C_4H_8$ අණුක සූත්‍රය යටතේ ඇති චක්‍රිය නොවන සමාවයවික සියල්ල අඳින්න.

(b) (i) $CH_3CH_2Br$ සංයෝගයේ ආරම්භ කර පියවර 4ට නොවැඩි ක්‍රමයකින් $CH_3-CH(Br)-Br$ (C ට H සහ Br සම්බන්ධ) සංයෝගය සාදා ගන්නේ කෙසේද?

(ii) $CH_3CH_2-CHBr_2$ සංයෝගයේ ආරම්භ කර පියවර 3ට නොවැඩි ක්‍රමයකින් $CH_3CH_2CH_2Br$ සංයෝගය සාදා ගන්නේ කෙසේද?

(c) (i) $CH_3=C(CH_3)-CH_3$ සහ $HBr$ අතර ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ප්‍රධාන ඵලයේ ව්‍යුහය ලියන්න.

(ii) එම ඵලය සෑදීමට අදාළ යාන්ත්‍රණය ලියන්න.

(09) (a) A, B සහ C යනු ආනන්තරික ද්‍රව්‍ය අඩංගු නැති ආවර්තයක පිහිටි අනුයාත මූල ද්‍රව්‍ය තුනකි. A සිසිල් ජලය සමඟ ප්‍රතික්‍රියා කර D ද්‍රාවණය සහ E වායුව සාදයි. නමුත් B සහ C සිසිල් ජලය සමඟ ප්‍රතික්‍රියා නොකරයි. නමුත් C ඉහත D ද්‍රාවණය සමඟ ප්‍රතික්‍රියා කර E වායුව සාදයි.

i. $A, B, C, D$ සහ $E$ හඳුනාගෙන රසායනික සූත්‍ර ලියන්න.

ii $A, B$ හා $C$ වල වායු නියම රසායනික සංකේත භාවිතා කර ඉහතදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

iii. ඉහත $A$ සහ $B$ මූලද්‍රව්‍ය වාතයේ දහනය කළ විය සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(b) ප්‍රථම d ගොනුවට අයත් මූල ද්‍රව්‍ය දෙකක කාබනේට අඩංගු මිශ්‍රණයන් භාවිතා කර සිදු කළ පරීක්ෂණ පහත දැක්වේ.

| පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|
| 1. ඝන මිශ්‍රණය තනුක $HCl$ වල ද්‍රාවණය කරන ලදී. | කොලපාටට හුරු ද්‍රාවණයක් ලැබුණි. |
| 2. ඉහත (1) හි ලද ද්‍රාවණයට වැඩිපුර NaOH එකතු කරන ලදී. | කොළ පාට අවක්ෂේපයක් $(P_1)$ ලැබුණි. |
| 3. ඉහත (2) හි ලද අවක්ෂේපය පෙරා වෙන්කරන ලදී. | කොළ පාට ද්‍රාවණයක් $(P_2)$ ලැබුණි. |
| 4. ඉහත කොළ පාට ද්‍රාවණයට $H_2O_2$ වැඩිපුර එකතු කරන ලදී. | කහ පාට ද්‍රාවණයක් $(P_3)$ ලැබුණි. |
| 5. කහ පාට ද්‍රාවණයට ත. $HCl$ එකතු කරනලදී. | තැඹිලි පාට ද්‍රාවණයක් $(P_4)$ ලැබුණි. |
| 6. ඉහත (2) හි ලද කොළ පාට අවක්ෂේපයට වැඩිපුර $NH_4OH$ එකතු කරන ලදී. | තද නිල් පාට ද්‍රාවණයක් $(P_5)$ ලැබුණි. |

i. කාබනේට දෙකෙහි ඇති කැටායන දෙක හඳුනාගන්න.

ii ඉහත $P_1$ සිට $P_5$ දක්වා වර්ණවලට හේතු වන විශේෂ රසායනික සූත්‍ර ලියා ඒවායේ $IUPAC$ නාම ලියන්න.

iii. ඉහත 5ට අදාළ ප්‍රතික්‍රියාව සඳහා තුලිත සමීකරණය ලියන්න.

(10) (a) i. සල්ෆර් වල ස්ඵටික බහුරූපී ආකාර දෙක නම් කරන්න.

ii සල්ෆර් සංයෝගවල දී පෙන්වන ඔක්සිකරණ අවස්ථා සඳහන් කර ඒවා එක එකක් සඳහා උදාහරණය බැගින් ලියන්න.

iii. සල්ෆර් සාදන ඔක්සිඅම්ල දෙකක ලුවිස් ව්‍යුහ ඇඳ නම සඳහන් කරන්න.

(b) පහත සඳහන් ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

i. උණු සාන්ද්‍ර $NaOH$ සහ $Cl_2(g)$ අතර

ii රත්කල $CuO$ සහ $NH_3(g)$ අතර

iii. $H_2O_2(l)$ සහ $H^+ / KMnO_4$ අතර

(c) $KIO_3$ වල $1.07g$ ක් අඩංගු ජලීය ද්‍රාවණයක් වැඩිපුර $KI$ සමඟ ආම්ලික මාධ්‍යයේ දී ප්‍රතික්‍රියා වීමට සළස්වන ලදී. එහිදී පිටවූ $I_2$ සමඟ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කිරීම සඳහා $Na_2S_2O_3$ ද්‍රාවණයකින් $45.0\ cm^3$ අවශ්‍ය විය.

(Na = 23, S = 32, K = 39, O = 16, I = 127)

භාවිතා කළ $Na_2S_2O_3$ ද්‍රාවණයේ සාන්ද්‍රණය ගණනය කරන්න.

# ආවර්තිතා වගුව

## ஆவர்த்தன அட்டவணை

## Periodic Table

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය
## රසායන විද්‍යාව I

| | | | | |
|---|---|---|---|---|
| (1) - 4 | (11) - 5 | (21) - 2 | (31) - 3 | (41) - 3 |
| (2) - 2 | (12) - 5 | (22) - 2 | (32) - 2 | (42) - 2 |
| (3) - 1 | (13) - 4 | (23) - 4 | (33) - 4 | (43) - 5 |
| (4) - 3 | (14) - 3 | (24) - 1 | (34) - 5 | (44) - 4 |
| (5) - 5 | (15) - 2 | (25) - 3 | (35) - 2 | (45) - 1 |
| (6) - 3 | (16) - 5 | (26) - 5 | (36) - 4 | (46) - 4 |
| (7) - 3 | (17) - 1 | (27) - 4 | (37) - 3 | (47) - 2 |
| (8) - 1 | (18) - 3 | (28) - 3 | (38) - 1 | (48) - 3 |
| (9) - 2 | (19) - 2 | (29) - 5 | (39) - 3 | (49) - 1 |
| (10) - 4 | (20) - 1 | (30) - 1 | (40) - 2 | (50) - 5 |

## රසායන විද්‍යාව II
## A කොටස ව්‍යුහගත කොටස

(01) a). පහත දක්වා ඇත්තේ $N_2O_3$ අණුවේ සැකිලි ව්‍යුහය යි.



I. එම අණුව සඳහා වඩාත් පිළිගත හැකි ලුවිස් ව්‍යුහ අඳින්න.



ල.08

II. මෙම අණුව සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. (I හි ව්‍යුහය හැර)



ල.05 × 3 = 15

III. (I) හි ඇඳි ලුවිස් ව්‍යුහය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පරමාණුව | $N_A$ | $N_B$ |
|---|---|---|
| ඔක්සිකරණ අංකය | +2 | +4 |
| පරමාණුව වටා හැඩය | කෝණික | තලීය ත්‍රිකෝණාකාර |
| ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | තලීය ත්‍රිකෝණාකාර | තලීය ත්‍රිකෝණාකාර |

IV. ලුවිස් ව්‍යුහය ඇසුරින් පිළිතුරු සපයන්න. ල.2 × 06 = 12

අ) $O\widehat{N_A}N_B$ හා $N_A\widehat{N_B}O$ යන කෝණ අතුරින් වඩා විශාල කෝණය කුමක්දැයි කෙටියෙන් පහදන්න.

$N_A\widehat{N_B}O$ වේ. (ල.02)

$N_A$ මත එකසර ඉලෙක්ට්‍රෝන යුගලක් ඇත. එවිට එහි ඇති බන්ධන ඉලෙක්ට්‍රෝන යුගල අතර විකර්ෂණයට වඩා එකසර ඉලෙක්ට්‍රෝන යුගලය සහ බන්ධන ඉලෙක්ට්‍රෝන යුගලය අතර විකර්ෂණය ප්‍රබලය. ∴ බන්ධන කෝණය කුඩාවේ.

ල.06

ආ) $N_A - O$ බන්ධන දිග හා $N_B - O$ බන්ධන දිග සැලකූ විට වඩා දිගින් වැඩි බන්ධනය කුමක්ද?

$N_B - O$ ............ ල.05

b). පහත දී ඇති අයනය ($NCO^-$) සඳහා ඇදි ලුවිස් ව්‍යුහ සළකන්න.

$\ddot{N} \equiv C - \ddot{\underset{..}{O}}:^{\ominus}$

එම ලුවිස් ව්‍යුහය ඇසුරින් පහත දී ඇති පරමාණුවල බන්ධන සෑදීමට සහභාගි වන මුහුම්කාක්ෂික මොනවාදැයි නම් කරන්න.

N : sp මුහුම් කාක්ෂික / 2p කාක්ෂික

C : sp මුහුම් කාක්ෂික / 2p කාක්ෂික

O : $sp^3$ මුහුම් කාක්ෂික ല.3×3 = 9

c) පහත දැක්වෙන සංයෝග අතරින් වඩාත් ගැලපෙන පිළිතුරු තොරන්න.

$TiO_2$ , $NO$ , $NH_3$ , $H_2O_2$ , $Cl_2$ , $H_2S$ , $SO_2$

(i) ලා කොළ පැහැයට හුරු කහ පාට විෂ වායුවකි.

$Cl_2$

(ii) නෙස්ලර් ප්‍රතිකාරකයක පෙඟවූ පෙරහන් කඩදාසියක් දුඹුරු පැහැයට හරවන වායුවක්.

$NH_3$

(iii) කාමර උෂ්ණත්වයේ දී සෙමින් වියෝජනය වන අතර හිරු එළිය හමුවේ වියෝජනය වේගවත් වන සංයෝගය.

$H_2O_2$

(iv) තීන්ත නිෂ්පාදනයේ දී යොදා ගන්නා සුදු පැහැති සංයෝගය

$TiO_2$

(v) වියුග්ම ඉලෙක්ට්‍රෝනයක් සහිත සංයෝගය

$NO$

(vi) කෝණික හැඩයක් ඇති ත්‍රි පරමාණුක අණුවකි.

$H_2S$ හෝ $SO_2$

(vii) ආම්ලික $K_2Cr_2O_7$ සමඟ ප්‍රතික්‍රියා කර තැඹිලි පාට ද්‍රාවණය පැහැදිලි කොළ පැහැයට හරවන සංයෝගය.

$SO_2$.

ල.3×7 = 21

d) වරහන් තුළ දී ඇති ගුණය වැඩිවන පිළිවලට දි ඇති රසායනික ප්‍රභේදය සකස් කරන්න.

(i) $Cu$, $Co^{3+}$ , $Ni^{2+}$ , $Zn$ (වියුග්ම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව,)

$Zn$ < $Cu$ < $Ni^{2+}$ < $Co^{3+}$

(ii) $Mg(OH)_2$ , $Ca(OH)_2$ , $KOH$ , $Sr(OH)_2$ (ජලයේ ද්‍රාව්‍යතාවය)

$Mg(OH)_2$ < $Ca(OH)_2$ < $Sr(OH)_2$ < $KOH$

(iii) $Mg^{2+}$ , $Na^+$ , $Be^{2+}$ , $Cl^-$ (අයනික අරය)

$Be^{2+}$ < $Mg^{2+}$ < $Na^+$ < $Cl^-$

(iv) $CO_2$ , $H-\overset{\overset{O}{||}}{C}-H$ , $CH_3OH$ , $CH_4$ (තාපාංකය)

$CH_4$ < $CO_2$ < $H-\overset{\overset{O}{||}}{C}-H$ < $CH_3OH$ ල.6×4 = 24

(02) a) A නමැති සංයෝගයේ ඇති මූලද්‍රව්‍ය හා ඒවායේ ස්කන්ධ ප්‍රතිශත පහත දැක්වේ.

| මූල ද්‍රව්‍ය | $Mn$ | $S$ | $H$ | $O$ |
|---|---|---|---|---|
| ස්කන්ධ ප්‍රතිශතය% | 21.2 | 12.3 | 4.6 | 61.8 |

$(Mn = 55, S = 32, H = 1, O = 16)$

I. A හි ආනුභවික සූත්‍රය කුමක්ද?

| Mn | S | H | O |
|---|---|---|---|
| $\frac{21.2}{55}$ | $\frac{12.3}{32}$ | $\frac{4.6}{1}$ | $\frac{61.8}{16}$ ✓ |
| 0.38 | 0.38 | 4.6 | 3.86 ✓ |
| $\frac{0.38}{0.38}$ | $\frac{0.38}{0.38}$ | $\frac{4.6}{0.38}$ | $\frac{3.86}{0.38}$ ✓ |
| 1 : | 1 : | 12 : | 10 ✓ |

ලෙ 5×4 = 20

ආනුභවික සූත්‍රය = $MnSH_{12}O_{10}$ ✓

II. A තුල පවතින සියළුම $H$ පරමාණු පවතින්නේ ජලය ලෙස පමණක් නම් $A$ හි අණුක සූත්‍රය සොයන්න.

$MnSO_4 . 6H_2O$ ලෙ .05

III. A තුල ඇති මැංගනීස් අයනයේ ඔක්සිකරණ අංකය කුමක්ද?

+2 ලෙ .05

IV. එම මැංගනීස් අයනයේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

$1s^2 2s^2 2p^6 3s^2 3p^6 3d^5$. ලෙ .05

V. A සංයෝගයේ (නිර්ජලීය ලවණයේ) IUPAC නාමය ලියන්න.

manganese (II) sulfate ලෙ .05

VI. A හි අඩංගු ඇනායනයේ ලුවිස් ව්‍යුහ ඇඳ දක්වන්න.



ලෙ .05

VII. A හි ජලීය ද්‍රාවණයකට $BaCl_2$ ද්‍රාවණයක් එක් කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද?

සුදු පාට අවක්ෂේපයක් ලැබේ.

b) A සිට E දක්වා ලේබල් කර ඇති පරීක්ෂණ නල වල පහත සඳහන් ඝන සංයෝග අඩංගු වේ.

$Mg(NO_2)_2$ , $FeS$ , $Na_2CO_3$ , $K_2SO_3$ , $Na_2S_2O_3$

මේ එක් එක් ඝන සංයෝගයට තනුක $HCl$ එක් කළ විට ලැබෙන ඵල පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| ඝන සංයෝගය | ඵල පිළිබඳ විස්තරය |
|---|---|
| (A) | හුණු දියර කිරිපාට කරන X වායුව පිට කරයි. |
| (B) | ආවේණික කටුක ගඳක් ඇති විෂ වායුවක් වන Y වායුව පිට කරයි. |
| (C) | කටුක ගඳක් ඇති අවර්ණ වායුවක් වන Z වායුව පිට කරයි. නලය තුළ ලා කහ පාට ආවිලතාවයක් ඇතිවේ. |
| (D) | වර්ණවත් වායුවක් වන U පිටකරයි. |
| (E) | කටුක ගඳක් ඇති Z වායුව පිට කරයි. |

I. A, B, C, D , E යන ඝන සංයෝග හඳුනාගන්න.

A $Na_2CO_3$ B $FeS$ C $Na_2S_2O_3$

D $Mg(NO_2)_2$ E $K_2SO_3$ ල . 4×5 = 20

II. X, Y, Z, U යන වායු හඳුනා ගන්න.

$X = CO_2$ $Z = SO_2$

$Y = H_2S$ $U = NO_2$

ල . 3×4 = 12

III. Y වායුව හඳුනා ගැනීමට යොදා ගත හැකි ප්‍රතිකාරකයක් ලියන්න.

ලෙඩ් ඇසිටේට් හෝ $H^+/KMnO_4$ හෝ $H^+/K_2Cr_2O_7$

IV. A - E දක්වා සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

* $Na_2CO_3 + 2HCl \longrightarrow 2NaCl + CO_2 + H_2O$
* $FeS + 2HCl \longrightarrow FeCl_2 + H_2S$
* $Na_2S_2O_3 + 2HCl \longrightarrow 2NaCl + S + SO_2 + H_2O$
* $Mg(NO_2)_2 + 2HCl \longrightarrow MgCl_2 + NO_2 + NO + H_2O$
* $K_2SO_3 + 2HCl \longrightarrow 2KCl + SO_2 + H_2O$

ල . 3×5 = 15

(03) a) I. පරිපූර්ණ වායු සමීකරණය ලියා එහි පද හඳුන්වන්න.

$PV = nRT$ ල . 02

P = පීඩනය n = මවුල ගණන

V = පරිමාව R = සාර්වත්‍ර වායු නියතය T = නිරපේක්ෂ උෂ්ණත්වය

ල . 01×5 = 5

II. ඒ ඇසුරින් ඩෝල්ටන්ගේ ආංශික පීඩන නියමය ව්‍යුත්පන්න කරන්න.

V පරිමාවක් ඇති බඳුනක T නම් උෂ්ණත්වයක ඇති A හා B නම් පරිපූර්ණ වායු දෙකක් අඩංගු මිශ්‍රණය සැලකූවිට ;

A වල ආංශික පීඩනය = $P_A$ , B වල ආංශික පීඩනය = $P_B$ , A හි මවුල = $n_A$ . B හි මවුල = $n_B$ , මිශ්‍රණයේ මුළු පීඩනය $P_T$ , මිශ්‍රණයේ මුළු මවුල $n_T$

A සඳහා PV= nRT යෙදූවිට ·

$P_AV = n_ART$

$n_A = \frac{P_AV}{RT}$

B වායුවට ; PV = nRT යෙදූවිට ·

$P_BV = n_BRT$

$n_B = \frac{P_BV}{RT}$

මුළු මිශ්‍රණයට යෙදූ විට ;

$P_TV = n_T.RT$

$n_T = \frac{P_TV}{RT}$

$n_T = n_A + n_B$

$\therefore \frac{P_TV}{RT} = \frac{P_AV}{RT} + \frac{P_BV}{RT}$

$\therefore P_T = P_A + P_B$ . ල . 2×10 = 20

5

b) පරිමාව 5 $dm^3$ වන දෘඩ බඳුනක් තුල $O_2$ වායුව 9.6 g ක් ද $He$ වායුව 0.48 g ක් ද 300 K උෂ්ණත්වයක් තබා ඇත. He = 4, O = 16, RT = 2500 J $mol^{-1}$ යැයි සළකන්න.

i. එම වායු වල ආංශික පීඩන වෙන වෙනම සොයන්න.

$n_{O_2} = \frac{9.6\,g}{32\,g\,mol^{-1}} = 0.3\,mol$ ✓

$n_{He} = \frac{0.48\,g}{4\,g\,mol^{-1}} = 0.12\,mol$ ✓

$P_{O_2} = \frac{nRT}{V}$ ✓

$P_{O_2} = \frac{0.3\,mol \times 2500\,J\,mol^{-1}K^{-1} \times 300\,K}{5 \times 10^{-3}\,m^3}$ ✓

$P = 4.5 \times 10^{7}\,Nm^{-2}$ ✓

$P_{He} = \frac{nRT}{V} = \frac{0.12\,mol \times 2500\,J\,mol^{-1}K^{-1} \times 300\,K}{5 \times 10^{-3}\,m^3}$ ✓

$= 1.8 \times 10^{7}\,Nm^{-2}$ ✓

ල .2 × 10 = 20

ii. මිශ්‍රණයේ මුළු පීඩනය ගණනය කරන්න.

$P_T = P_{O_2} + P_{He}$ ✓ $= (4.5 \times 10^{7}) + (1.8 \times 10^{7})\,Nm^{-2} = 6.3 \times 10^{7}\,Nm^{-2}$ ✓ ල .4×2=8

ii. ඉහත ගණනය කිරීමේ දී ඔබ යොදා ගත් උපකල්පන වෙතොත් ඒවා සඳහන් කරන්න.

වායු පරිපූර්ණ බව. ල .5

c) i. $N_2(g) + 3H_2(g) \rightarrow 2NH_3(g)$ යන රසායනික ප්‍රතිකියාවේ සම්මත උත්පාදන එන්තැල්පිය $(\Delta H_f^{\theta})$ ගණනය කරන්න. ඒ සඳහා පහත තාප රසායනික දත්ත භාවිතා කරන්න.

| බන්ධනය | $(\Delta H_D^{\theta})$ / $kJ\,mol^{-1}$ |
|---|---|
| $N \equiv N$ | 944 |
| $H - H$ | 436 |
| $N - H$ | 388 |

$\Delta H_f^{\theta} = \sum \Delta H_D^{\theta}$(බිඳුණු) $- \sum \Delta H_D^{\theta}$(සෑදුණු) ✓ ල .05

$= [944 + (3 \times 436)]\,kJ\,mol^{-1} - [388 \times 6\,kJ\,mol^{-1}]$ ✓ ල .10

$= (944 + 1308) - (2328)\,kJ\,mol^{-1}$

$= -76\,kJ\,mol^{-1}$ ල .05

ii. ඉහත ප්‍රතික්‍රියාවේ එන්ට්‍රොපි වෙනස (+) අගයක් ද (-) අගයක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

ප්‍රතික්‍රියාව සිදුවීමේදී වායුමය අණු ගණන අඩු වී ✓ ඇත.

∴ $\Delta S = -$ වේ. ✓ ල .08

iii. $T$ උෂ්ණත්වයේ දී ඉහත ප්‍රතික්‍රියාව සඳහා එන්තැල්පි වෙනස ($\Delta H$), එන්ට්‍රොපි වෙනස ($\Delta s$) හා ගිබ්ස් යෝජ්‍ය ශක්ති වෙනස ($\Delta G$)අතර සම්බන්ධය කුමක්ද?

$\Delta G = \Delta H - T.\Delta S$ ල. 04

iv. ඉහත ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ වන T උෂ්ණත්වය පිළිබඳ අදහස් දක්වන්න.

ස්වයංසිද්ධ වීමට $\Delta G < 0$ විය යුතුය.
$\Delta H$ හා $\Delta S$ යන දෙකම (−) අගයන් බැවින් $\Delta G < 0$ වීමට නම් T අඩු අගයක් විය යුතුය. ල. 2×4 = 08

(04) X යනු අණුක සූත්‍රය $C_6H_{12}$ වන හයිඩ්‍රොකාබනයකි. $A, B, C, D$ හා $E$ යනු X හි සමාවයවික 5 කි. ඒවා අතරින් $A$ පමණක් ප්‍රතිරූප අවයව සමාවයවිකතාව (ප්‍රකාශ සක්‍රීයතාව) දක්වන අතර, $B, C, D$ හා $E$ පාරත්‍රිමාන (ජ්‍යාමිතික) සමාවයවිකතාව දක්වයි. $A$ හා $B$ $H_2 / Ni$ සමඟ ප්‍රතික්‍රියාවෙන් එකම සංයෝගය ලෙස $F$ ද, $C$ හා $D$ $H_2 / Ni$ සමඟ ප්‍රතික්‍රියාවෙන් එකම සංයෝගය ලෙස $G$ ද ලැබෙයි. එසේම, $D$ සමමිතික හයිඩ්‍රොකාබනයකි.

i. A, B, C, D, E, F, හා G හි ව්‍යුහ පහත කොටු තුළ අඳින්න.

A: $CH_2=CH-CH(CH_2CH_3)-CH_3$

B: $CH_3-C(H)=C(CH_3)-CH_2CH_3$

C: $CH_3-C(H)=C(H)-CH_2CH_2CH_3$

D: $CH_3-CH_2-C(H)=C(H)-CH_2CH_3$

E: $CH_3-C(H)=C(H)-CH(CH_3)-CH_3$

F: $CH_3CH_2-CH(CH_3)-CH_2CH_3$

G: $CH_3CH_2CH_2CH_2CH_2CH_3$

A සිට E ල 7×5=35
F හා G . ල. 5×2 = 10

ii. A, HBr සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලය වන H හි ව්‍යුහය අඳින්න.

$CH_3-CH(Br)-CH(CH_2CH_3)-CH_3$ ල. 5.

iii. H ප්‍රකාශ සමාවයවිකතාවය දක්වයිද? හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

දක්වයි. අසමමිතික C පරමාණු ඇත. ල. 5

iv. H හි *IUPAC* නාමය ලියන්න.

2-bromo-3-methylpentane ........................................ ☉ ·5

b) පහත ප්‍රතික්‍රියාවල දී ලැබෙන ඵලයන් දී ඇති කොටු තුළ ලියන්න.

i. $CH_3CH = CH_2 \xrightarrow{Br_2\ /\ CCl_4}$ P

ii. $CH \equiv CH \xrightarrow{\text{වැඩිපුර}\ Na}$ Q

iii. $(CH_3)_2\,C = CH_2 \xrightarrow{HBr/\text{පෙරොක්සයිඩ}}$ R

iv. $CH_3CH = CHCH_3 \xrightarrow{\text{සා.}\ H_2SO_4}$ S $\xrightarrow{H^+/H_2O/\Delta}$ T

v. $CH_3C \equiv CH \xrightarrow[HgSO_4\ /\Delta]{dil\ H_2SO_4}$ U

vi. $CH_3C \equiv C-C(CH_3)_2-CH_3 \xrightarrow[BaSO_4/\text{quinoline}]{H_2\ /\ Pd}$ V

vii. $C_2H_6 +$ වැඩිපුර $Cl_2 \xrightarrow{\text{හිරු එළිය}}$ W

| | | |
|---|---|---|
| P<br>$CH_3-CH-CH_2$<br>with Br on each carbon ($CH_3-CHBr-CH_2Br$) | Q<br>$\overset{+}{Na}\,\overset{-}{C}\equiv\overset{-}{C}\,\overset{+}{Na}$ | R<br>$CH_3-CH(CH_3)-CH_2Br$ |
| S<br>$CH_3-CH(OSO_3H)-CH_2CH_3$ | T<br>$CH_3-CH(OH)-CH_2CH_3$ | U<br>$CH_3-C(=O)-CH_3$ |
| V<br>$CH_3-CH=CH-C(CH_3)_3$ | W<br>$Cl_3C-CCl_3$ | |

☉ ·5×8 = 40

5 a. i. අර්ථ දැක්වීම   ල. 10

ii. $NaHCO_3$ උදාසීන වීමේදී අවශෝෂණය කළ තාපය

$= 80\ cm^3 \times 4.2\ J.K^{-1}.cm^{-3} \times 0.5\ K$

$= 0.168\ KJ$   ල. 20.

උදාසීන වූ $NaHCO_3$ මවුල ගණන $= 1\ mol\ dm^{-3} \times \frac{40}{1000}\ dm^3 = 0.04\ mol$ ✓

∴ $NaHCO_3$ මවුල 1 ක් උදාසීන වීමේදී අවශෝෂණය කළ තාපය $= \frac{0.168}{0.04}\ KJ$ ✓

$= 4.2\ KJ$ ✓

∴ $\Delta H^\ominus = 4.2\ KJmol^{-1}$ ✓

ල. 5 x 4 = 20

(iii). $HCO_3^-{}_{(aq)} + H^+{}_{(aq)} \longrightarrow H_2O_{(l)} + CO_{2(g)}$

$\Delta H^\ominus = \Sigma H^\ominus_{ඵල} - \Sigma H^\ominus_{ප්‍රතික්‍රියක}$ ✓

$= [-285.8 + (-393.5)] - [-692]\ KJmol^{-1}$ ✓

$= +12.7\ KJmol^{-1}$ ✓   ල. 10 x 3 = 30

iv. $HCO_3^-$ උදාසීනකරණය වන විට උෂ්ණත්වය අඩුවේ. එනම් අවට පරිසරයෙන් තාපය උරා ගනී. ∴ $\Delta t$ කුඩා අගයක් වේ.   ල. 10.

b. i. $Ca_{(s)} + C_{(s)} + \frac{3}{2}O_{2(g)} \longrightarrow CaCO_{3(s)}$   $\Delta H^\ominus = -1206\ KJmol^{-1}$

ii. $C_8H_{18(l)} + \frac{25}{2}O_{2(g)} \longrightarrow 8CO_{2(g)} + 9H_2O_{(l)}$   $\Delta H^\ominus = -2200\ KJmol^{-1}$

iii. $Na_{(s)} \longrightarrow Na_{(g)}$   $\Delta H^\ominus = +108\ KJmol^{-1}$

iv. $CH_{4(g)} \longrightarrow CH_{3(g)} + H_{(g)}$   $\Delta H^\ominus = 428\ KJmol^{-1}$

v. $\frac{1}{2}I_{2(s)} \longrightarrow I_{(g)}$   $\Delta H^\ominus = 106.6\ KJmol^{-1}$

ල. 06 x 5 = 30

c.




$\Delta H^\ominus + 62.2\ KJmol^{-1} = 213.2\ KJmol^{-1}$ ✓

$\Delta H^\ominus = 213.2 - 62.2$ ✓

$= 151\ KJmol^{-1}$ ✓

ල. 5 x 6 = 30

(6) . a . i . $PV = \frac{1}{3} mN\bar{c}^2$ ල.05

$P$ = පීඩනය
$V$ = පරිමාව
$m$ = අණුවක ස්කන්ධය
$N$ = අණු ගණන
$\bar{c}^2$ = වර්ග මධ්‍යන්‍ය වේගය

ල.1×5 = 05

ii. $\bar{c}^2 = \frac{3RT}{M}$ ල.10

iii. $\bar{c}^2 = \frac{3 \times 8.314\ J K^{-1} mol^{-1} \times 500 K}{50 \times 10^{-3}\ Kg\ mol^{-1}}$ ✓ ල.20

$= 2.49 \times 10^5\ m^2 s^{-2}$ ✓ ල.20

b. $n_{BaCl_2} = \frac{24.96\ g}{208\ g mol^{-1}} = 0.12\ mol$ ✓

$n_{Na_2SO_4} = \frac{0.25\ mol dm^{-3} \times 500 dm^3}{1000} = 0.125\ mol$ ✓

$BaCl_2 + Na_2SO_4 \longrightarrow BaSO_4 \downarrow + 2NaCl$ ✓ ල.15

0.120 mol ✓ 0.125 mol ✓

මෙහිදී $BaCl_2$ සම්පූර්ණයෙන්ම වැය වේ. ∴ ඒ සඳහා

$n_{BaSO_4} = 0.12\ mol$ ✓

එහි ස්කන්ධය $= 0.12\ mol \times 233\ g mol^{-1}$ ✓

$= 27.96\ g$ ✓ ල.7×5 = 35

c. I. S වලට වඩා O හි විද්‍යුත් සෘණතාවය වැඩිය. ✓ ∴ S–H බන්ධනයට වඩා O–H බන්ධනයේ ධ්‍රැවීකරණය වැඩිය. ✓ ∴ $H_2O$ අණු අතර H බන්ධන ✓ ද $H_2S$ අණු අතර ද්විධ්‍රැව - ද්විධ්‍රැව ආකර්ෂණ ✓ බල පවතින බැවිනි.

(ල.5×4 = ල.20)

II. සංයෝග දෙකෙහි ඇනායනය සමානය. කැටායනය වෙනස්ය. ✓
$Mg^{2+}$ හි අරය < $Na^+$ හි අරයට ✓
$Mg^{2+}$ හි ආරෝපණය > $Na^+$ හි ආරෝපණයට ✓
එවිට $Mg^{2+}$ හි ධ්‍රැවීකරණ බලය > $Na^+$ හි ධ්‍රැවීකරණ බලය ✓

ල.5×4 = 20.

⑦ a. I. A = Cl
B = P
C = S    ල.30

II     ල.10

iii. S වටා ඇති මුළු e යුගල ගණන = 4
VSEPR e යුගල ගණන = 4
එකසර e යුගල ගණන = 2
බන්ධන e යුගල ගණන = 2
∴ හැඩය කෝණික.    ල.10.

iv. S    ල.10.

b. i. N : O : H අනුපාතය
2 : 3 : 4
∴ ආනුභවික සූත්‍රය = $N_2O_3H_4$ වේ.    ල.20

ii. n = 1
∴ අණුක සූත්‍රය = $N_2O_3H_4$    ල.10.

iii. කැටායනය     ඇනායනය 

ල.20

iv. $H_2O + 2NH_4^+ \longrightarrow N_2O + 10H^+ + 8e$    ල.20

v. $8e + 10H^+ + 2NO_3^- \longrightarrow N_2O + 5H_2O$    ල.20

⑧ a. I.  (ල.10).     (ල.10).

II.  (ල.10).

iii.  , 

        ල.5×4 = 20

b. i.




ල.05 × 7 = 35

ii.




ල.5 × 5 = 25

c. i.




ල.10

ii.




ල.5 × 6 = 30

(9). a. I. A = Na, B = Mg, C = Al, D = NaOH, E = $H_2$

ල. 5×5 = 25

II. $Na + 2H_2O \longrightarrow 2NaOH + H_2$ (ල. 05)

$2H_2O + 2Al + 2NaOH \longrightarrow 2NaAlO_2 + 3H_2$

ල. 10

III. $2Na + O_2 \longrightarrow Na_2O$ ✓

$2Na +$ වැඩිපුර $O_2 \longrightarrow Na_2O_2$ ✓

$2Mg + O_2 \longrightarrow 2MgO$ ✓

$6Mg + 2N_2 \longrightarrow 2Mg_3N_2$ ✓

ල. 5 × 04 = 20

b. i. $Ni^{2+}$, $Cr^{3+}$ ල. 20

ii. $P_1 = Ni(OH)_2$ ✓ nickel (II) hydroxide. ✓

$P_2 = [Cr(OH)_6]^{3-}$ ✓ hexahydroxidochromate (III) ion ✓

$P_3 = CrO_4^{2-}$ ✓ Chromate ion ✓

$P_4 = Cr_2O_7^{2-}$ ✓ dichromate ion ✓

$P_5 = [Ni(NH_3)_6]^{2+}$ ✓ hexaamminenickel (II) ion.

ල. 5×10 = 50

$2CrO_4^{2-} + 2H^+ \longrightarrow Cr_2O_7^{2-} + H_2O$ ල. 20.

(10). a. i. රොම්බසීය සල්ෆර්, ඒකානති සල්ෆර් ල. 11

ii. −2 +2 +4 +6

$H_2S$ $SF_2$ $SO_2$ $H_2SO_4$ ල. 3×8 = 24

iii. 

සල්ෆියුරස් අම්ලය. ✓



සල්ෆියුරික් අම්ලය. ✓



තයෝසල්ෆියුරික් අම්ලය.

ල. 5 × 4 = 20.

b. i. $6NaOH + 3Cl_2 \longrightarrow 5NaCl + NaClO_3 + 3H_2O$

ii. $3CuO + 2NH_3 \longrightarrow N_2 + 3Cu + 3H_2O$

iii. $6H^+ + 5H_2O_2 + 2MnO_4^- \longrightarrow 2Mn^{2+} + 5O_2 + 8H_2O$

ල. 15 × 3 = 45

c. $IO_3^- + 5I^- + 6H^+ \longrightarrow 3I_2 + 3H_2O$

$2S_2O_3^{2-} + I_2 \longrightarrow S_4O_6^{2-} + 2I^-$

ල. 20

$$n_{S_2O_3^{2-}} = \frac{x \times 45}{1000} = 45x \times 10^{-3}\ mol$$

පිටවූ $n_{I_2} = \frac{45x}{2} \times 10^{-3}\ mol$

$$n_{IO_3^-} = \frac{1.07\ g}{214\ g\,mol^{-1}} = 5 \times 10^{-3}\ mol$$

සෑදුන $n_{I_2} = 15 \times 10^{-3}\ mol$

$$\frac{45x \times 10^{-3}}{2} = 15 \times 10^{-3}$$

$$x = 0.66$$

∴ $Na_2S_2O_3$ වල සාන්ද්‍රණය = $0.66\ mol\,dm^{-3}$

ල. 5 × 6 = 30